

# කටුගස්ඇල්ල - රත්නපුර

චාරිකා සටහන් සහ සේයා රූ
**චාමර සුලක්ඛණ**



මිණිපුරය නැත්තම් රත්නපුරයට කීප වරක් ගිහින් තිබුනත් රත්න-පුරයේ තියෙන දිය ඇලි බලල ඉවර කරන්න වුනේ නැහැ. මේ ගමන ගියේ එවැනි දිය ඇලි කීපයක් බලන්න හිතාගෙන. රත්නපුර ඉඳන් වෙරලුප හංදියෙන් හැරිල කිලෝමීටර 2.5 විතර යන්න ඕන. එතැන තියෙන පොඩි පාලම ගාවින් යන වාහන නම් නවත්තන්න වෙනවා. එතැන ඉඳන් මීටර 100ක් විතර ගුරු පාරක් දිගේ ඇතුලට යන්න ඕන. ගමේ කාගෙන් ඇහුවත් පාර

**අපූරු සතුන් හා ගස් වැල් ඇති වම් වගේ තැන් වල සුන්දරත්වය විඳින්න. හැබැයි විනාස කරන්නේ නැතිව එන්න.**






දැනගන්න පුළුවන්. කටුගස් දොලෙන් ඇතිවෙන මේ අපූරු දිය ඇල්ල පෝෂණය කරන්නේ ශ්‍රී පාද අඩවියේ ජල පෝෂක උල්පත් වලින්.

දිය ඇල්ල ලඟට යන එක නම් ලේසි නෑ. මොකද දිය ඇල්ලේ මීටරයක් විතර උස පහල කොට-සක් තියෙනවා. ගොඩක් අය හිතන්නේ ඒක තමයි අවසන කියල. නමුත් එතැනින් ගල් උඩින් පැන පැන යන ගමන ලේසි නොවුනත් ගමන අවසානයේ මීටර 6ක් උස කටුගස් ඇල්ලට ලඟාවෙන්න පුළුවන්. වර්ශාව අඩු කාලයේදී පහසු ගමනක් වුනත් වර්ශාව අධික කාලයේදී නම් දිය ඇල්ල ලඟ යනවා කියන්නේ ජීවිතය මරණය අතර සටනක්. මොකද ලිස්සන ගල් හා සැඩ වතුර කියන දෙක එකතු වෙලා ජීවිත ගනනක් බිලි අරන් තියෙන නිසා.

තැනින් තැන තියෙන ස්වභාවික පොකුණු වල නාන්න වුනත් පුළුවන්. දිය ඇල්ල පාමුලත් ලස්සන ස්වභාවික පොකුණක් තියෙනවා. ඒකත් නාන්න පුළුවන් තැනක්. නමුත් වතුර වැඩි කාලයේදී නම් ඒ වැඩේ සුදුසුයි කියන්න බෑ. ප්‍රදේශයේ අය වුනත් නාන්න එන මෙතැන මත්ද්‍රව්‍ය පාවිච්චි කරල පොලිතීන් විසි කරල විනාස කරල. මත්පැන් භාවිත කරල නම් මේ තැන යන්න හිතන්න වත් එපා. මොකද ඒ ගමන ඔයාලගේ ජීවිතය අවසන් කරන්න පුළුවන්.

අපූරු සතුන් හා ගස් වැල් ඇති වම් වගේ තැන් වල සුන්දරත්වය විඳින්න. හැබැයි විනාස කරන්නේ නැතිව එන්න.

http://sulakkhana.blogspot.com.au/